# 2000 අංක ..02.. දරන බස්නාහිර පළාතේ පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධන) ප්‍රඥප්තිය

1990 අංක 02 දරන ප්‍රඥප්තිය මගින් සංශෝධිත-1989 අංක 01 දරන බස්නාහිර පළාතේ පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

01 මෙම ප්‍රඥප්තිය 2000 අංක 02 දරන බස්නාහිර පළාතේ පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

1990 අංක 2 දරන ප්‍රඥප්තිය මගින් සංශෝධිත 1989 අංක 01 දරන ප්‍රඥප්තියේ 2 වගන්තිය සංශෝධනය කිරීම

02 1990 අංක 02 දරන ප්‍රඥප්තිය මගින් සංශෝධිත 1989 අංක 01 දරන බස්නාහිර පළාතේ පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ ප්‍රඥප්තියේ 02 වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කෙරේ.

1. එම (02) වගන්තියේ (ආ) උප වගන්තිය ඉවත් කිරීමෙන් ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීම.

    i. බස්නාහිර පළාත් සභාවේ ගරු සභාපතිතුමාට ගෙවනු ලබන මාසික වැටුපෙන් 66%ක් මාසික වැටුප වශයෙන් සහ බස්නාහිර පළාත් සභාවේ සභාපතිවරයාට මාසිකව ගෙවනු ලබන අනෙකුත් සියලු දීමනාවලට සමාන මාසික දීමනාවක් බස්නාහිර පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයාට ගෙවිය යුතුය".

    ii. එම ගෙවීම 1998.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විය යුතුය."